PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

අතිගරු ජනාධිපතිතුමා,
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

20-11-2019

ගරු ජනාධිපතිතුමනි ,

**<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වන විධායක ජනාධිපති ධූරයට පත්වූ ඔබතුමන්ට පැෆ්රල් සංවිධානයේ සුබපැතුම්.</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිනව ජනාධිපතිතුමන් වශයෙන් ඔබතුමන් තේරීපත්වීම පිළිබඳව අපගේ හෘදයංගම සුභාශිංෂනය පිරිනමමු.

එමෙන්ම පැවති මැතිවරණය නිදහස් හා සාධාරණවත්, සාමකාමීවත් විශේෂයෙන්ම පොලිතීන්, පෝස්ටර් කටවුට්වලින් තොරව පරිසර හිතකාමීව පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳවද අපගේ විශේෂ ස්තුතිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙත පිරිනැමීමට කැමැත්තෙමු.

එමෙන්ම කැබිනට් මණ්ඩලය සීමා කිරීම, දේශපාලන ඡායාරූප වෙනුවට රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීම, පුද්ගලික කාර්ය මණ්ඩලය හා වාහන සීමා කිරීම, රාජ්‍ය සේවකයින්ගේ විදේශ ගමන් සීමාකිරීම වැනි පළමු දින කිහිපය තුළ ගනු ලැබූ තීරණ පිළිබඳව අපගේ ප්‍රසාදය පලකරමු.

ඔබතුමන් විසින් ඉදිරිපත් කල ප්‍රතිපත්ති ප්‍රකාශයනයට අනුකූලව ධූර කාලය තුළදී කටයුතු කරනු ඇති බවත් මැතිවරණ සාධාරණව පැවැත්වීම සඳහා බෙහෙවින්ම ඉවහල් වන මැතිවරණයකදී අපේක්ෂකයෙකුට වියදම් කල හැකි උපරිම සීමා ඇතුළත් නීති කෙටුම්පතට නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයට පෙර සම්මත කරගැනීමට ක්‍රියාකරන ලෙසත් මැතිවරණ නීති යාවත්කාලීන කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ආරක්ෂා වන පරිදි ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය පිළිබඳ නිශ්චිත නෛතික තත්ත්වයන් බලාත්මක කිරීමට කටයුතු කරන ලෙස අප ඔබතුමන්ගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමු.

තවද බොහෝ සේ කල් ඉක්මවා ඇති පළාත් සභා මැතිවරණය පැවැත්වීම කෙරෙහි ඔබතුමන්ගේ කාරුණික අවධානය යොමුකෙරෙනු ඇතැයි අපේක්ෂා කරමු.

මෙයට
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ